සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

II ශ්‍රේණිය
Grade 11

සිංහල සාහිත්‍ය රසාස්වාදය

පැය තුනයි
three hours

සැලකිය යුතුයි.

- I කොටසෙහි 01,02 ප්‍රශ්නවලටත්, II කොටසෙහි 03 වැනි ප්‍රශ්නයටත්, III කොටසෙහි 04, 05, 06, 07 ප්‍රශ්න වලින් තෝරා ගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

---

## I කොටස

01 (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ''බල එකෙක් ඇත. උන් ඇතත් වැටුප් වියදම් තොප පමණකට දෙමි''

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) මෙම ප්‍රකාශය උපුටාගත් කෘතිය නම් කරන්න.

(ii) තිරසර ගුණෙන් යුතු උතුමකු හට පවර
සමුදුර සියල් කිඳලෙක තුඹසෙක සුනෙර
පුවතර මෙ දඹදිව මළුවෙක සිය ගෙදොර
ඔහු කර නො වන සැපතෙක් එබැවින් කවර

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මෙම පද්‍යය උපුටා ගත් කෘතියේ කතුවරයා නම් කරන්න.

(iii) ''ඈ බොල, උඹ බඩ පුරවා ගන්නවාද?''

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින් ද?

(ආ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කුමන අවස්ථාවක දී ද?

(iv) කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්

(අ) මෙහි ''ඔබ'' යනුවෙන් ආමන්ත්‍රණය ලබන්නේ කවු ද?

(ආ) උතුමන්ගේ ඇසුර නිසා සිදුවන්නේ කුමක් ද?

(v) ''පෙර ආසනයේ උන් තෙනැත්තෝ ම පළමු කොට ම බටු ය ''

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) මෙහි සඳහන් ''පෙර ආසනයේ ම උන් තෙනැත්තෝ'' කවුරුන් ද?

(ලකුණු 4 x 5 = 20 යි)

02 පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න.

හිස නමා ගති ඇ
සිහින් රතැඟිලි පටලවා ගති,
සතියකට පෙර ගෙනා වර
විළිබරය මගෙ රන්වන් මනාලිය

දූල් තිර අස්සෙන්
පෙනෙයි ඇ
ඔබ යනු මොබ එනු
පට පිළී ගෙන අබරණ පෙට්ටි ගෙන

ඇසෙයි නොපෙනෙන විටත්
සාලයෙන් කාමරයට
කාමරයෙන් සාලයට
යන පා හඬ

මා වෙත එතත් ඇ
වුවමනාවක් කිසිත් නැතිවද
නො රැඳෙයි, පලා යෙයි.

ගෑ විලවුනෙහි,
නැත, රන්වන් සමෙහි
හෙළන සුස්මෙහි සුවඳය ඒ
ඇ බඳ සුවඳ
දූනෙන්නෙ මට විතර ද?

පෙනෙයි ඇ
ඇසෙයි
දූනෙයි
මට ගේ හැම තැන

(i) මෙම පැදි පෙළට පාදක වී ඇති අත්දැකීම
(ii) පැදි පෙළ නිර්මාණයේ දී කවියා යොදා ගත් බස් වහර
(iii) මනාලියගේ ලජ්ජාශීලී ස්වරූපය
(iv) චිත්තරූප මැවීමෙහි ලා කවියා පෑ සමත්කම
(v) කවියා මනාලිය කෙරේ ඇති ආකර්ෂණීය බව (ලකුණු 25 යි)

## II කොටස

- පහත සඳහන් ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් එක කොටසකට පමණක් පිළිතුරු සපයන්න

03 බෝධිසත්ත්වයෝ ද පසේ බුදුන් වහන්සේගේ පාත්‍රයට කැවුම් කොටස පිළිගන්වා ''ස්වාමීනි, ඉදින් යොදුන් සියයක උනත් මුන් මාගේ බලයෙන් ගෙන්වාගෙන මට පාදපරිචාරිකා කරන්ට සමර්ථ වෙම්ව'' යි ප්‍රාර්ථනා කළෝ ය.

කිපී ගොස් පසේ බුදුන්ගේ පාත්‍රයේ තුබූ කැවුම් හැර ගත් හෙයින් මුබය විසුළු ව ගියේ ය. මේ තෙම මොවුන්ගේ පූර්ව ක්‍රියා වන්නේ ය. බෝධිසත්ත්වයෝ ප්‍රභාවතීන් ගිය නියාව අසා ශෝකයට පැමිණියහ. අවශේෂ නාටක ස්ත්‍රීහු නොයෙක් ප්‍රකාරයෙන් සිත් නළවන්නාහු පොලඹාගත නුහුණුවහ.

ප්‍රභාවතීන් නැති රජ ගෙය කුස රජ්ජුරුවන්ට හිස් වූවාක් මෙන් වැටහෙන්නේ ය. මෙලෙසින් රාත්‍රියෙහි බොහෝ දුක් විඳ අලුයම නැඟී සිට සාගල නුවරට ගොස් ප්‍රභාවතී දේවි කැඳවාගෙන එම් කියා මා එන තෙක් රාජ්‍යය පියාණන් වහන්සේට වේවායි මලණුවන්ට වේවායි පාවා දී ලීම් නම් නැවත ඇරගැන්ම ආයාස වේ දූයි සිතා මෑණියන් සීලවතී දේවිය සමීපයට ගොස් ''මෑණියන් වහන්ස, ධන ධාන්‍යාදීන් හරිත වූ ඇත්ඇණි අස්ඇණි-රියබලයයි සිව්රඟ සෙනෙඟින් යුක්ත වූ පංචකකුධභාණ්ඩයන් ඇති සියලු උපභෝග පරිභෝග වස්තුවෙන් සමෘද්ධ වූ මේ රාජ්‍යය ප්‍රභාවතී කැඳවාගෙන එන තෙක් පාවා ගත මැනැව'' යි මෑණියන්ට කියා අවසර ඉල්වූහ.

(i) බෝධිසත්ත්වයෝ පසේ බුදුන්ට කැවුම් පූජා කොට කුමක් ප්‍රාර්ථනා කළෝ ද? (ලකුණු 05 යි)
(ii) මේ පාඨයෙහි සඳහන් වන ආකාරයට බෝධිසත්ත්වයන්ගේ මුබය විසුළු ව ගියේ කුමක් නිසා ද ? (ලකුණු 05 යි)
(iii) ප්‍රභාවතීන් නැවත කැඳවා ගැනීම සඳහා කුමක් කළ යුතු යයි කුස රජු අදහස් කළේ ද? (ලකුණු 05 යි)
(iv) රාජ්‍යය පවරාදීමේ දී කුස රජු කටයුතු කළ ආකාරය නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

නැතහොත්

උපන්නෙත් මැරෙන්නෙත් තනියමයි ලොවේ
එයින් පිටත්තර වෙන විදියකින් නොවේ
එයින් එහෙම නම් තම යුතුකම හමුවේ
බියෙන් තැති ගැනුම අපහට තරම් නොවේ

නම්බුව කැමති අය ඇති නම් නො වී මුළා
ගම්මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
ලොම් සිදුරක තරම් වත් අඬ දබර නොලා
පිම්මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

උපන් ගමේ බල උරුමය රැක ගන්ට
සටන් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙන් නොගොස් අහුමුලුවල රිංගන්ට
ඉතින් යමව් ගම්මුන්ට ම එක් වෙන්ට

වඳින්නේ නැතිව ලොකු නිලධාරීන් ට
තමන්ගේ බලය උරුමය රැක ගන් ට
හිතින්වත් කැමති නම් එය කර ගන් ට
ඉතින් අඬ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අතත් පයත් ඔළුවත් වෙන වෙන ම කපා
කතත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අයුත්තකට අත් දෙක ඔසවන්ට එපා

අපේ රට අපේ ජාතිය අපේ ගම
අපේ අසල්වැසියා යන සියල් ලම
අපේ අතට අවනත කර ගෙන වහම
අපේ නමට සලකත දිවි දෙමු මෙහෙම

මුල බැස තිබෙන ගම්මුන්ගේ සමඟි සැපා
සොලොවා මරා වළලන්නට යොදා උපා
කුල මල උගුල් අටවන බොරු බණක් පපා
නිලධාරීන්ට විස්වාසය දෙන්ට එපා

(i) පද්‍ය පන්තිය නිර්මාණයේ දී කවියාගේ අපේක්ෂාව වී ඇත්තේ කුමක් ද? (ලකුණු 05 යි)
(ii) නම්බුව අපේක්ෂා කරන්නන් කටයුතු කළ යුතු ආකාරය දක්වන්න. (ලකුණු 05 යි)
(iii) ජනතාව තුළ පවත්නා කවර දුබලතා රටේ ස්වාධීනත්වය දිනා ගැනීමට බාධා වී ඇත්දැයි දක්වන්න. (ලකුණු 05 යි)
(iv) තම අරමුණ ඉටු කර ගැනීම සඳහා කවියා යොදා ගත් බස්වහර කෙබඳු දැයි විමසන්න. (ලකුණු 10 යි)

## III කොටස

මෙම කොටසෙන් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.
(පිළිතුර වචන 150ට නො අඩු විය යුතු ය.)

04. කුස ජාතකයෙන් අපට ලබාදෙන උපදේශ කවරේ දැයි නිදසුන් තුනක්වත් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 15 යි)

05. තිරිසන් සතුන් කෙරේ අවිචාරවත් ව කටයුතු කරන මිනිසුන් පිළිබඳව උපහාසාත්මකව බැලීම 'ඇත්ගාලේ දරුපෙම' පද්‍ය පන්තියෙහි අරමුණක් වී ඇත. විමසන්න. (ලකුණු 15 යි)

06. වැලපීම කෙටිකතාවේ ඉයෝනා පොටපොෆ් පාඨකයාගේ සාතිශය අනුකම්පාවට ලක් වේ. සුදුසු නිදසුන් තුනක්වත් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

07. යහපත් ධර්මෝපදේශයක් ලබා දීම උදෙසා ධර්මසේන හිමියන් යොදා ගත් බස් වහර කෙබඳු දැයි උදාහරණ තුනක්වත් ආශ්‍රයෙන් විස්තර කරන්න. (ලකුණු 15 යි)